# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 සැප්තැම්බර් මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2022.09.12 දින නිකුත් කරන ලදී)**


# දොස්තර සමන් වීරසිංහ පදනම (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**දොස්තර සමන් වීරසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## දොස්තර සමන් වීරසිංහ පදනම
## (සංස්ථාගත කිරීමේ)

## දොස්තර සමන් වීරසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"දොස්තර සමන් වීරසිංහ පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන මණ්ඩලයක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක      දරන දොස්තර සමන් වීරසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දොස්තර සමන් වීරසිංහ පදනම සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "දොස්තර සමන් වීරසිංහ පදනමේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) දොස්තර සමන් වීරසිංහ පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

3. සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ:— සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

(අ) ශ්‍රී ලංකාව තුළ ජීවත්වන සියලුම ජන කොට්ඨාස අතර සාමය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම;

(ආ) පාසැල් යන සහ පෙරපාසැල් යන දිළිඳු දරුවන්ට පොත්, නිල ඇඳුම්, ඉගෙනුම් ද්‍රව්‍ය, සංගීත උපකරණ, පෝෂ්‍යදායක ආහාර, ක්‍රීඩා උපකරණ, ඉගෙනුම් උපකාරක ලබාදීම සහ ඔවුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඇ) දිළිඳු ජනතාවට ඖෂධ සහ ආහාර සැපයීම;

(ඈ) කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඉ) මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඊ) තරුණයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම;

(උ) සමාන පරමාර්ථ ඇති දේශීය සංවිධාන හෝ පදනම් සමග සුහදතාව වර්ධනය කර ගැනීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම;

එසේ වුව ද, ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මගින් සිදුකරන වැඩ සමග ගැටුමක් ඇති නොකරන ආකාරයෙන් ඉහත පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

4. (1) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාපිත මණ්ඩලයේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව වසර 3 ක කාල පරිච්ඡේදයක් සඳහා තෝරාපත් කරගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ තවත් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

(2) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, වසර එකක් නොඉක්මවන කාලයකට ධුර දැරිය යුතු වන අතර, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සහ පත් කිරීම සඳහා රීති සකස් කිරීමට බලය තිබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍ය බලතල

**5.** මේ පනත සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව චංචල දේපළ අත්කර ගැනීම සහ සතු කර ගැනීමේ ද, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, සංස්ථාපිත මණ්ඩලය සතු යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදිකිරීමේ ද, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**6.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් කිසියම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, කලින් කල සංස්ථාපිත මණ්ඩලය මගින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස් කිරීම, නෙරපීම සහ ගෙවිය යුතු සාමාජිකත්ව ගාස්තු;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් වීමට අවශ්‍ය සුදුසුකම්;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධරයන් සහ සාමාජිකයන් තෝරාපත් කිරීම, ඉවත් වීම සහ ඉවත් කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාපිත මණ්ඩලය මඟින් එසේ සාදනු ලබන සෑම රීතියක්ම එකී රීති සකස් කර මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන අතර එසේ ප්‍රකාශනයට පත් කළ දිනයේ සිට බලාත්මක වනු ඇත.

අරමුදලෙන් ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල්

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙර දිනය වන තෙක් පැවති පදනම විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාපිත මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාපිත මණ්ඩලය සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී වියදම් කරන ලද සියලු ම මුදල්, භාර අරමුදල්වලින් ගෙවිය යුතු ය.

(3) සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වීමෙන් මාස හයක් ඇතුළත ලැබුණු දේශීය සහ විදේශීය අරමුදල් පිළිබඳ විස්තර ඇතුළත් සංස්ථාපිත මණ්ඩලය විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහා ම පැවැත් වූ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථ දක්වා ඇති පරිදි ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, පදනමේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය. එසේ වුව ද, සියලු ම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලැබීම් සම්බන්ධයෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවෙන් පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම

**10.** සංස්ථාපිත මණ්ඩලයේ කිසිම සාමාජිකයකු සංස්ථාපිත මණ්ඩලයේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔවුන්ගෙන් සංස්ථාපිත මණ්ඩලයට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**11.** සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ විගණනය සහ ගිණුම්**

**12.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් රජයේ විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයකුගෙන් යුතු එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව**

13. සභාපතිවරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු හා තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.